# ඩාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

40 වන කාණ්ඩය | 01 වන කලාපය | 2023 සැප්තැම්බර් කාලපය

# වසර 39ක් නොනිමි මහ ජවයක්




ශ්‍රමයේ වටිනාකම සොච්චමකට ලඝු කළ යුගයක, කම්කරු අයිතීන් ද තහනම් වචනයක් වූ අවධියක, නිදහස් වෙළඳ කලාප තුළ සිය දහඩිය හෙළනා කාන්තා ශ්‍රමයට වටිනාකමක් දෙන්නට, ස්වාධීන ස්ත්‍රී කණ්ඩායමක් ගත් වෑයමක මුදුන් ඵලයකි ඩාබිඳු. ගරු විවියන් ප්‍රනාන්දු කන්‍යා සොයුරිය, කුමුදුනි රෝසා, එච්. අයි. සමන්මලී, යන තිදෙනාගේ මූලිකත්වය යටතේ තවත් කම්කරු සොයුරියන් කිහිප දෙනෙකුගේ දායකත්වයෙන් ප්‍රථම ඩාබිඳු පුවත්පත දොරට වඩින්නේ 1984 වසරේ බිනර මසදී ය. එදා පටන් අද දක්වා වසර 39ක ගමන විල්ලුද මතින් පා තැබූවක් නොවේ. නොයෙකුත් හැල හැප්පීම්, වැටීම් මෙන්ම නැගිටීම් හා ජයග්‍රහණයන් තුළින් ඩාබිඳු පත්තරය ලැබූ බව නම් නොරහසකි.

විවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන සංවර්ධන වැඩ පිළිවෙළක් ලෙස නිදහස් වෙළඳ කලාප එවකට රජය විසින් හඳුන්වා දුන් අතර 1978 වසරේදී ප්‍රථම නිදහස් වෙළඳ කලාපය කටුනායක දී බිහිවිය. මෙහි සේවය සඳහා පැමිණි

2 වන පිටුවට...

## ඇතුළු පිටු

**02 පිටුව** - කතු වැකිය/ ඩාබිඳු 38 සංවත්සරය/ විදෙස් පුවත්
**03 පිටුව** - පොත් කියවීම/ සිතුවිල්ල
**04-05 පිටු** - සුභාශිංසන
**06-07 පිටු** - අපේ වැඩ
**08 පිටුව** - වසරක ගමන් මඟ

ඩාබිඳු සාමුහිකය

වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : Dabindu Collective Sri Lanka

# ආර්ථික අර්බුදය හමුවේ හෙටක් නැති රටක්

කටුක, අමිහිරි අත්දැකීම් පරයා ඩාබිඳු සාමුහිකය 2023 වසරේ සැප්තැම්බරයේ දී සිය 39 වන වසර සමරනු ලබයි. මේ දශක කිහිපය තුළ අප ආ ගමනේ දී දේශපාලන, ආර්ථික, සමාජ සංස්කෘතික තත්ත්වයන් තුළ සිදු වූ වෙනස්කම් නිසා රටේ පුරවැසියන්ට ව්‍යවස්ථාව, නීති ප්‍රතිපත්ති ප්‍රජාතන්ත්‍රවාදිව භුක්ති විඳීමට ඇති ඉඩකඩ අහුරන ලදී. වැඩ වර්ජන, අරගල තුළින් අයිතිවාසිකම් දිනා ගැනීමට සිදු වීම සාමාන්‍ය දෙයක් බවට පත් විය. ඊට පෙරමුණ ගන්නා නායකයින් සමාජ විරෝධී ත්‍රස්තවාදීන් ලෙස ලේබල් කරමින් සමාජ විරෝධී ත්‍රස්තවාදීන් ලෙස ලේබල් කරමින් විවිධ අණපනත් ගෙනෙමින් මර්දනය ඉතාමත් සූක්ෂම ලෙස පවත්වා ගෙන යාමට කටයුතු කිරීම නිසා ජන ජීවිත පීඩාවට පත්වීම වැළැක්විය නොහැකි විය. ආර්ථික අර්බුදය, කොවිඩ් වසංගතය නිසාම පහළම පන්තියේ ජනයාගේ කොඳු නාරටිය දෙකඩ කොට, අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහන පහසුකම් වල සීමාවන්ට ගොදුරු වීමට සිදු කොට ඉච්ඡාභංගත්වයට පත් කොට ඇත. නිෂ්පාදන ක්‍රියාවලියක් පිළිබඳ කිසිඳු විශ්ලේෂණයක් නොමැති අදූරදර්ශී පාලකයින් නිසාම රුපියලේ වටිනාකම අවප්‍රමාණ වීමෙන්, මුදල් සංචිත හිඟයකට මුහුණ පෑමට සිදු විය. එනිසාම දැයේ දරුවන්ට අධ්‍යාපන පහසුකම් ලබා දීමට නොහැකිව, රෝගීන්ට බෙහෙත් නොමැතිව, ඉන්ධන හා ගෑස් පෝලිම්වල මිය යෑමට පවා මෙරට ජනතාවට සිදු විය.

බඳු බර, ණය බර සෘජුවම පීඩිත පන්තියට වෙතම එල්ල කරමින්, බඳු වැඩි කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳව ජනතාව දැනුවත් නොකර බඳු ගෙවීම් පැහැර හරින ඉහළ පැලැන්තියේ සියළු වරප්‍රසාද හිමි ප්‍රභූ පන්තියට බඳු විරාම ලබා දීමට පාර්ලිමේන්තුවේ වැඩි ඡන්දයෙන් 50% - 100% දක්වා නිදහස් කොට ඇත. එසේම රටේ විශාලතම අරමුදල වන අර්ථසාදක අරමුදල කොල්ල කෑමට කටයුතු කරමින්, හාම්පුතා පිනවීම උදෙසා කම්කරු නීති ප්‍රතිසංස්කරණය තුළින් යටත් විජිත මානයකට රට ඇද දමා, IMF ණය උගුලේ ජනතාව අර්බුදයෙන් අර්බුදයට ලක් කරමින්, 1966 සිට මේ දක්වා 17 වරකට ණය ලබා ගනිමින් පරිපාලනයේ ගුණාත්මක බව පෙන්වීමට අපොහොසත් රජයන් ඒ පිළිබඳව වූ විශ්ලේෂණාත්ම සැලැස්ම දුර්වල බව පෙන්නුම් කොට ඇත. වගකිව යුත්තන් පෞද්ගලික ප්‍රශ්න විසඳා ගනිමින් පොදු ප්‍රශ්නය නොතකා අධිපතිවාදයට යෝග්‍ය සැලැසුම් සකසමින් කටයුතු කිරීම නිසා අයිතීන් තහවුරු කර ගැනීමට සිදු වන බව පීඩිත පන්තියට අවදානම් පෙන්නුම් කරයි.

1 පිටුවෙන්... **වසර 39ක් නොනිමි...**

බහුතරයක් කෘෂි ආර්ථිකය බිඳ වැටුණු ගොවි පවුල් වලින් පැමිණි ස්ත්‍රීන්ය. විරැකියාවට පිළියමක් වශයෙන් දේශපාලකයින් පෙන්වා දුන් රැකියා ඉල්ලමක් ලෙස නිදහස් වෙළඳ කලාප කරා ඔවුන් ගමෙන් නගරයට ඇදී ආවේ නිතැතිනි. වැඩිවන ශ්‍රම බලකායට ප්‍රමාණවත් රැකියා සැපයීම කෙරුණද ඊට සාපේක්ෂව නවාතැන් පහසුකම්, ප්‍රවාහන පහසුකම් යටිතල පහසුකම් හි සංවර්ධනයක් නොවීය. තවද සේවකයින්ගේ ශ්‍රම සූරා කෑම හා වැටුප් විෂමතා ආදිය මෙන්ම මඟතොටේදී සිදුවන ලිංගික හිරිහැර යනාදී ත්‍රිවිධ පීඩනයන්ට මුහුණ පෑමට මෙහි සේවය කරන කම්කරු තරුණියන්ට සිදුවිය. ඩාබිඳු පුවත්පත හරහා ආයතන තුළ සිදුවන අසාධාරණකම්, නේවාසිකාගාර සහ මහමඟදී මුහුණ දෙන ගැටලු සම්බන්ධව දිගින් දිගටම පළ වූ අතර දෛනික ජීවිතයේ අත්දැකීම් බෙදා හදා ගන්නට මෙන්ම නීති ආධාර ලබා දෙන්නටද අත්වැලක් විය. එසේම ඩාබිඳු පුවත්පත ඔවුන්ගේ නිර්මාණාත්මක හැකියාවන් ඉදිරිපත් කිරීමට හා දියුණු කර ගැනීමට තෝතැන්නක් විය. ඩාබිඳු වාර්තාවන් නුරුස්සන්නට වූ පාලකයෝ නීතිමය පියවර මෙන්ම, අපට ජීවිත තර්ජන එල්ල කිරීමට පවා සැහැසි වූහ. මෙවන් වූ අනේකවිධ තර්ජන ගර්ජන මැද වුවද අපි නොසැලී පෙරටම ගමන් කළෙමු.

1985 දෙවැනි නිදහස් වෙළඳ කලාපය බියගම ආරම්භ වූ අතර ස්ත්‍රී අධ්‍යාපන හා පුහුණුවීමේ ආයතනය නමින් අප බියගම වෙත ව්‍යාප්ත වූයේ බියගම පිහිටු වූ ප්‍රථම ස්ත්‍රී සංවිධානය වෙමිනි. මේ අතර බියගම කලාපයේ විවිධ කම්හල් තුළ සිදු කළ කම්කරු වැඩ වර්ජන සාර්ථක කර ගැනීමට අපගේ නොමසුරු සහාය ශ්‍රමයෙන් මෙන්ම මූල්‍යමය වශයෙන් ද ලබා දුන්නෙමු. ඩාබිඳු පුවත්පතට සමගාමීව ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය, කම්කරු අයිතීන්, වෘත්තීය සෞඛ්‍ය, ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ අත්පොත් ද මුද්‍රණය විය. එසේම කම්කරු කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා ස්වයං රැකියා පුහුණුව, ඉංග්‍රීසි, පරිගණක සහ ආත්ම ආරක්ෂාව සඳහා පුහුණු පංති, නිරාවරණ වැඩසටහන්, තරුණ කඳවුරු, වෛද්‍ය සායනයන් ආදිය ද දියත් විය. කම්කරු අරගල වලට මෙන්ම වෙනත් ප්‍රජා මූල සංවිධාන සමඟ එකමුතු වී කම්කරු ස්ත්‍රීන්ගේ අරගල වලටද සහාය ලබා දුන්නෙමු. කම්කරු අයිතීන් පිළිබඳව, සාමය හා මානව හිමිකම්, ස්ත්‍රී අයිතීන්, ස්ත්‍රීවාදී මතවාදය, ප්‍රජාතන්ත්‍රවාදය තුළ ස්ත්‍රීන් සතු භූමිකාව යන මාතෘකා පිළිබඳ සමාජය තුළ කතිකාවතක් ඇති කරන්නට උර දුන්නෙමු.

පශ්චාත් යුද සමය තුළ උතුරු නැගෙනහිර ප්‍රදේශවලින් දමිළ කම්කරුවන් නිදහස් වෙළඳ කලාප වෙත සංක්‍රමණය වූ අතර සිංහල භාෂාව නොදත් ඔවුන් වෙනුවෙන් දමිළ බසින් අත් පත්‍රිකා, පොත් පිංචවල් හා ඩාබිඳු පුවත්පත මුද්‍රණය කර බෙදා හැරියෙමු. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේ දී වව්නියා සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක වෙතද ඩාබිඳු ව්‍යාප්ත කරන්නට අපට හැකිවිය. කම්කරු දැනුවත් කිරීමේ වැඩසටහන්, නායකත්ව පුහුණු, වෛද්‍ය සායන, නිරාවරණ වැඩසටහන් පවත්වමින් ඔවුන්ගේ දැනුම, නායකත්ව කුසලතා වර්ධනය කළෙමු. තවද පාර්ශවකරුවන්ගේ හමුවන් තුළින් කම්කරු ගැටලු සම්බන්ධව රාජ්‍ය ආයතන දැනුවත් කරමින් ඒවාට පිළියම් යෙදීමට පියවර ගතිමු.

2020 වසරේ ලොවම බිලිගත් කොවිඩ් වසංගත සමය තුළ කම්කරුවන් මුහුණ පෑ ගැටලු ඉදිරිපත් කිරීමට මෙන්ම, අනීතික නිරෝධායන වැඩපිළිවෙළෙහි දුර්වලතා පෙන්වා දීමටත් ඩාබිඳු පුරෝගාමී විය. ඉන් නොනැවතී කම්කරුවන්ට අවැසි මානුෂීය ආධාරයන් ලබා දීමටත් පියවර ගතිමු. මේ හරහා වර්ධනය වූ සාමාජිකත්වය ද සමඟින් ඩාබිඳු සිය ගමන්මගෙහි තවත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන්නේ 2021 වසරේදී ඩාබිඳු සාමුහික සංගමය නමින් වෘත්තීය සමිතියක් ලෙස ලියාපදිංචි වීමෙනි.

කොවිඩ් බලපෑම සහ වසර ගණනාවක අදූරදර්ශී දේශපාලන තීන්දු තීරණ හේතුවෙන් රට තුළ උද්ගත වූ ආර්ථික අර්බුදය හමුවේ කම්කරුවන් තවදුරටත් පීඩා විඳින විට පොදු කුස්සිය වැනි නව සහන වැඩසටහන් කම්කරුවන් වෙනුවෙන් දියත් කිරීමට අපට හැකිවිය. එසේම 2022 වසර තුළ මුළු මහත් ජනතාවක් වශයෙන් දූෂිත පාලකයන්ට හා දේශපාලන ක්‍රමයට එරෙහිව දියත් කළ අරගලයට ද ඩාබිඳු සක්‍රිය ලෙස දායක විය. මෙවර ඩාබිඳු සිය 39 වන වසර සමරනු ලබන්නේ ලේ, දහඩිය මතින් දිනාගත් කම්කරු නීති මර්දනය කිරීමේ උත්සාහයන් මෙන්ම, වසර ගණනාවක් කඹුරමින් උපයා ගත් EPF/ETF අරමුදල් ද ණය බර පියවීමට යොදා ගන්නා ප්‍රයත්නයන්ට එරෙහිව කරන අරගල මධ්‍යයෙනි. මෙතෙක් ආ ගමන් මග තුළ අප ජාති, කුල, පන්ති, පාට භේදයන් නොසලකා වැඩ කළෙමු. ගත වූ 38 වසර පුරා අප වටා එක් රොක් ව සිටි ඩාබිඳු සාමුහිකය ශක්තිමත් කිරීමට අප වටා සිටි සංවිධාන වලටත්, කලාපයේ සේවය කරන සේවක සේවිකාවන්ටත් අපගේ ප්‍රණාමය පුද කරමු.

# ණය ප්‍රතිව්‍යුහගතකරණය හා කම්කරු නීතියේ යෝජිත නව සංශෝධන



වර්තමාන රාජ්‍ය තත්වය අනුව නව කම්කරු නීති ප්‍රතිසංස්කරණ සහ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයේ සෘජු බලපෑම වැඩ කරන ජනතාව මත පටවා ඇති අතර එහි බලපෑම සාකච්ඡාවට බඳුන් කිරීමේ වැදගත්කම සහ එමගින් සිදු වීමට නියමිත අකටයුතුකම්වලට, මර්දනයන්ට සහ හිංසනයන්ට එරෙහිව සංවිධානාත්මකව සහ සාමූහික ප්‍රයත්නයක යෙදීමේ අවශ්‍යතාවය කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛ අංගයක් වන ඇඟළුම් ක්ෂේත්‍රයේ බහුතරය වන කාන්තාව සතු වගකීමකි. සේවක අර්ථසාධක අරමුදල පොලී අනුපාත පාලනයට යොදා ගැනීමේ දී ශ්‍රී ලංකා රජයට ණය ලබා දී ඇත්තේ අඩු පොලී අනුපාතිකයකට යි. දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව කැබිනට් මණ්ඩලයට යෝජනාවලියක් මේ වන විට ඉදිරිපත් කර ඇත. මෙම නව සංශෝධනයන්ට සහ EPF-ETF මංකොල්ලයට එරෙහිව විරෝධතාවය සහ අකමැත්ත ප්‍රකාශ කිරීම වෙනුවෙන් ඩාබිඳු සාමූහිකය, වෙළඳ කලාපීය සහයෝගීතාවය සහ එක්වෙමු සංවිධානය සමඟ ඒකාබද්ධව අත්වැල් බැඳ ගනිමින් සංවිධානාත්මක වැඩසටහන් කිහිපයක්ම පසුගිය මාස කිහිපයේම පැවැත්විණි. ඩාබිඳු සාමූහිකය මෙම සියළු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබුවේ ඩාබිඳු සාමූහික සංගමය හරහා බව සතුටින් දැනුම් දෙමු. ඩාබිඳු සාමූහික සංගමය 2021 මැයි මස උතුරු පලාතේ කම්කරු ප්‍රජාවගේ ඉල්ලීම මත ආරම්භ කෙරුණු අතර කිලිනොච්චි, වව්නියා සහ බියගම, කටුනායක ඇඟළුම් සේවක සේවිකාවන් සාමාජිකත්වය දරනු ලබයි. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාපවල සහ අනෙකුත් නිෂ්පාදන ප්‍රදේශවල සේවය කරන කම්කරුවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම ඩාබිඳු සාමූහික සංගමයේ දැක්මයි. අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ඩාබිඳු සාමූහික සංගමය සියළුම ක්‍රියාකාරකම් සහ ක්‍රියාවලීන්හි විනිවිදභාවය සහ වගවීමේ වටිනාකමකින් යුතුව ක්‍රියාත්මක කිරීම සහ ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගික ශානතිය, ආගම ජාතිය, ආර්ථික තත්ත්වය යනාදී සාධකයන් නොසළකා නිදහස් වෙළඳ කලාපයන්හි සහ අනෙකුත් නිෂ්පාදන ප්‍රදේශයන්හි සියළු සේවකයින් දෙස සංවේදීතාවයෙන් හා සමානාත්මතාවයෙන් කටයුතු කිරීම අපගේ මෙහෙවර වේ.

ඩාබිඳු සාමූහික සංගමය හරහා සිදු කරනු ලැබූ වැඩසටහන් අතර විරෝධතා ව්‍යාපාර, අත්සන් ව්‍යාපාර, පෙත්සම් ලබා දීම සහ උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රමුඛ වේ. 2023 ජුලි මස 28 වන දින පෙත්සම් අත්සන් කිරීම සිදු වූ අතර ජුලි 12 සහ 14 දෙදින කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරිපිටත් ජුලි 19 වන දින ඇවරිවත්ත ඔරලෝසු කනුව ඉදිරිපිටත් ජුලි 25 වන දින කොටුව දුම්රිය පොළ ඉදිරිපිටත් විරෝධතා පැවැත්විණි. "එක්වෙමු" සමාජ ව්‍යාපාරය සමඟ අත්වැල් බැඳ ගනිමින් අගෝස්තු මස 06 වන දින උපදේශන වැඩසටහනක් ද අගෝස්තු 23 වන දින කොටුව දුම්රිය පොළ ඉදිරිපිට දී විරෝධතා ව්‍යාපාරයක් පැවැත්විණි. වෙළඳ කලාපීය සහයෝගීතාවය, වෘත්තීය සමිති සහ සිවිල් සංවිධාන නියෝජිතයින් සහ නීතීඥවරුන්ගේ සහයෝගීතාවයෙන් අගෝස්තු 23 සහ 24 වන දින අත්සන් ව්‍යාපාරයක්, අත් පත්‍රිකා බෙදාහැරීම සහ විරෝධතා සාර්ථකව පැවැත්විණි. "එක්වෙමු" සංවිධානය සමඟ ඒකාබද්ධ සාර්ථක විරෝධතාවයක් අගෝස්තු 28 වන දින කොටුව දුම්රිය පොළ ඉදිරිපිටත් පැවැත්විණි. වෙළඳ කලාපීය සහයෝගීතාවය, වෘත්තීය සමිති සහ සිවිල් සංවිධාන නියෝජිතයින් සහ නීතීඥවරුන්ගේ සහයෝගීතාවයෙන් සැප්තැම්බර් 06 සහ 07 වන දින අත් පත්‍රිකා බෙදාහැරීම සහ විරෝධතා සාර්ථකව පැවැත්විණි.

# සිතුවිල්ල

ශ්‍රී ලංකාව තුළ බහු ජාතිකයින් විසින් අප රට තුළ කර්මාන්ත ඉදි කෙරුවේ රටේ ආර්ථිකය දිරි ගැන්වීම උදෙසා ය. එකළ මෙරටට පැමිණි විදේශිකයින්ගෙන් බඳු අය නොකරන ලදී. දිවයින පුරා පිහිට වූ නිදහස් වෙළඳ කලාපවල සේවය කරන කම්කරුවන්ට අඩු වැටුපකට සේවය ලබා දීමට සිදු වූයේ නොයෙකුත් කෙනෙහෙලිකම් මැදය. ශ්‍රමිකයන් ලෙස අපගේ ශ්‍රමයට සරිලන වැටුපක් ලබා ගැනීමට අපට අදටත් නොහැකි විය. ලබා ගත් දෙයක් ඇත්නම් ඒ අරගල හා උද්ඝෝෂණ මඟිනි. එහි දී අපට ජීවිත පූජා කිරීමටත් අනේකාකාර දුෂ්කතාවයන්ට මුහුණ දීමටත් සිදු විය. ඇතමුන් අතුරුදන් කිරීම්වලට ලක් විය.

මීට පෙර සේවක අර්ථසාධකය ඩැහැ ගැනීමට සිදු කරන ලද රජයේ අත පෙවීම් හමුවේ සියළු සේවකයින් වීථි බැස අරගල කරන ලදී. මෙම සිදුවීමේ දී සියළු දෙනාට බැට කෑමට සිදු වූයේ ඉතාමත් කුරිරු ලෙසිනි. නැවත වරක් ශ්‍රමිකයින්වන අපට කොකා පෙන්වමින් ඉතාමත් නින්දිත ලෙස සේවක අර්ථසාධකය කොල්ල කෑමට රජය ලකලෑහැස්ති වෙයි. ඇයි දෙවියනේ අපටම කෙනෙහෙලිකම් කරන්නේ? අපට ඉතිරි ජුකියටම දිය වී ගිය කටු බොඩිය පමණි. කසාදයක් කර ගැනීමට අපට ඉතිරි වී තිබූ අර්ථසාධකය ද ඇස් පනා පිටම උදුරා ගනිද්දී සිතට වාරු නොදෙයි. රජයේ ඉහළ නිළධාරීන් අයථා ලෙස ධනය කොල්ල කමින් සුඛෝපභෝගී ජීවිත ගත කමින් අසරණ කම්කරුවන්ගේ සේවක අර්ථසාධකය මංකොල්ල කෑමට මාන ලබති. විවෘත ආර්ථිකයෙන් පසුව පත් වූ සියළු රජයන් විසින් සූරා කෑවේ අපගේ වටිනා ශ්‍රමය සහ සොච්චම් වැටුපයි. 1948න් පසුව රටක් ලෙස නිදහස ලැබූව ද කම්කරුවන් ලැබූ නිදහසක් නොමැත. කුසට අහරක් නොමැතිව බෝඩින් ජීවිත තුළ දුක්ඛිත ජීවිත ගත කරමින්, නිදි නොලබා අතිකාල කරමින් ශ්‍රමයට සරිලන වැටුපක් ද නොමැතිව උපයා ගන්නා ලද අර්ථසාදක අරමුදලින් මෙසේ මුදල් මංකොල්ල කෑම ඉවසුම් නොදෙන්නකි. රටේ පවතින උද්ධමනය හමුවේ කර්මාන්ත වැසී යාමත් සමඟ කම්කරුවන් මහමගට වැටෙමින් පවතී. මේ තත්ත්වය හමුවේ සේවක අර්ථසාධකයට කෙරෙන අනිසි අත පෙවීම් කම්කරුවා අගතියෙන් අගතියට පත් කරයි.

සමන්තා

# ඩාබිඳු 39 වන සංවත්සර සුබපැතුම්

## Congratulations to Dabindu

Congratulations to Dabindu Collective on 38 years of unwavering dedication to the cause of women's rights, particularly in the garment industry. Your remarkable journey has been a beacon of hope and progress for countless women across Sri Lanka. Through your relentless efforts and commitment, you have not only empowered women but also transformed the lives of garment workers, giving them a voice, dignity, and the respect, they deserve. Your advocacy for fair labor practices, safe working conditions, and equal pay has left an indelible mark on the industry, setting an example for others to follow. As you celebrate this milestone, may you continue to inspire change, champion equality, and pave the way for a brighter future where women's rights are not just upheld but cherished. Your dedication is a testament to the power of collective action and serves as a reminder that positive change is possible. Here's to another 38 years of making a difference, breaking barriers, and standing up for the rights of women everywhere. Your work is an inspiration to us all, and we look forward to seeing the continued impact of your organization in the years to come. Warmest congratulations once again on this incredible achievement!

**Abhiramy Sivaloganathan**

## දිරි දුන් ඩාබිඳු

ඩාබිඳු සාමූහිකයේ සැමට ස්තූතියි.
ආවේ දුරක් ගෙවලයි
දුක් කම්කටොළු මැද ඔබ සැවොම
පෑවේ සිනා මුසු මුහුණයි අප සැමට
දුප්පත් පෝසත් භේදයක් නෑ කළේ අපට
තාමත් මග බලනවා එන්නට ඩාබිඳු සෙවන යට
සතුටුයි අවංකවම ඔබ සැවොම ගැන
හැල හැප්පීම් මැද ඔබලා යන මග
මල් වැසි වසීවා සැමදා
තෙරුවන් සරණයි චමිලා මිස් ඇතුළු
කාර්යය මණ්ඩලයේ සැමට....

**නිරෝෂා අමන්දොළුව - කටුනායක**

## හිතාදර ඩාබිඳු සාමුහිකයේ සහෝදරියනි,

පුරා වසර 39ක ඉතිහාසයට උරුමකම් කියන ඔබ සංවිධානය, කාන්තා සේවිකාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ගැටළු පිළිබඳව සහ ඔවුන්ගේ දහඩිය සහ අයිතිවාසිකම් වෙනුවෙන් සාමුහික හඬක් නැගීමේ අරමුණින් ආරම්භ කරන ලද ඔබ සංවිධානය අඛණ්ඩව සේවය කිරිම සදහා ශක්තිය ධෛර්යය ලැබේවායි සුභ පැතුම් ගෙන එන්නේ, ඩාබිඳු සාමුහිකයේ 39 වෙනි සංවත්සරයට සුභාසිරි !!!

**කාන්තා සහයෝගිතා පෙරමුණ, මහනුවර. (WFL)**

දුප්පත් මිනිසුන්ගේ ජීවිත සරු කළ ඩාබිඳු සාමූහිකයට සුභ දිනයක් වේවා .... කිලිනොච්චිය දිස්ත්‍රික් සම්බන්ධීකාරක වන මම, දාඩිය බිංදුවක් සේ අප දෙසට ගමන් කරන මේ දහදිය බිඳු එකමුතුවේ උපතට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමි...

**අයින්කරන් ශ්‍රී කාන්ති**

ඩාබිඳු සාමූහිකය මම පසුගිය වසර 10ක් පුරාවට හොඳින් හඳුනනවා. මෙම සංවිධානය ආන්තික ජනතාව සම්බන්ධයෙන් පෙනී සිටීමේ දී විශේෂයෙන්ම ඇඟළුම් ක්ෂේත්‍රයේ කාන්තාවන් වෙනුවෙන් ගන්නා උත්සාහය, තර්ජන මැද වුවත් ප්‍රශංසනීය බව පැවසිය යුතුයි. මෙම කාන්තා කණ්ඩායම කුඩා පිරිසක් වුවත් සමාජ අසාධාරණකම් හමුවේ නොබියව පෙනී සිටින පිරිසක් බව ද විශේෂයෙන්ම දැක්විය යුතුයි. මෙවැනි කණ්ඩායම් ශ්‍රී ලංකාවේ සමස්ත ජනතාව වෙනුවෙනුත්, රාජ්‍ය මර්දනය හමුවේ නොසැලී කටයුතු කරන චමිලා තුෂාරි ඇතුළු කාන්තා කණ්ඩායමට තව දුරටත් ඉදිරියට මෙම සේවාව කරගෙන යාමට සුබ පතමි.

**ජේසුදාසන්**

## සැමරුම

කාන්තා අයිතිවාසිකම් සුරකීම උදෙසා පුරා වසර 38 ක කාල සීමාවක් තුළ ඩාබිදු සාමුහිකය විසින් සිදු කළ මෙහෙවර හා කැපවීම තවත් චිරාත්කාලයක් ඉදිරියට පවත්වාගෙන යෑමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලැබේවායි අපි හදවතින්ම ප්‍රාර්ථනා කරමු.

**හසිත් සඳරුවන්**

**(Breath International Sri Lanka)**

නිදහස් වෙළඳ කලාපයේ කාන්තාවන් වෙනුවෙන් වසර 38ක් කැපවී කළ විශිෂ්ට සේවයට ඩාබිඳු සාමූහිකයට සුබ පැතුම්! ඔබගේ නොසැලෙන යෝධ ශක්තිය හරහා කාන්තාවන්ගේ ජීවිත වෙනස් කරමින්, වඩාත් ශක්තිමත් සහ ඵලදායී යාන්ත්‍රණ නිර්මාණය කිරීමට ඔබ දායක වී ඇත. සාමූහිකයේ නිර්මාතෘ සමන්මලී මහත්මිය සහ සාමූහිකයට නායකත්වය ලබා දෙන චමිලා තුෂාරි සහෝදරිය ඇතුළු කණ්ඩායමේ සියළු දෙනාගේ කැපවීමට ගරු කරමි. මේ කරන සේවය පහසු නැති බව දනිමි දවස ගානේ මුහුණදෙන අර්බුද, ගැටළු වලට ඉක්මන් ප්‍රතිචාර අවශ්‍ය වේ. කෙතරම් අසීරු වුවද, ඒ ප්‍රශ්න වලට මැදිහත් වෙමින්, සාධාරණත්වය හා යුක්තිය වෙනුවෙන් ඔබ සටන් කරයි. ඩාබිඳු සාමූහිකයේ ශක්තියත් එයමයි. ඔබේ සැබෑ බලවේගය, ඔබගේ මනුෂ්‍යත්වයයි. ඔබ කරන අමිල කාර්යය සඳහා මම සුබ පැතුම් පමණක් නොව, හෘදයාංගම කෘතඥතාව ප්‍රකාශ කරමි. ඔබගේ උත්සාහය අප සැම දිරිගන්වයි. ඔබට ශක්තිය හා ධෛර්යය පතමි!

**ව්‍රායි බල්තසාර්**

# ඩාබිඳු 39 වන සංවත්සර සුබපැතුම්




ඩාබිඳු සාමූහික සංගමය කම්කරු අපගේ දාඩිය බිඳු මෙන් අප ලබා දෙන සේවයට නීතිමය වශයෙන් අපේ ගැටළුවලට අප සෙවූ විසඳුම් ලබා දෙන අපේම ඩාබිඳු සාමූහික සංගමය නොනැවතී දිගටම කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටින යුක්තිය උදෙසා සටන් කරන අපගේ ඩාබිඳු සාමූහික සංගමය අප වැනි කම්කරුවන්ට ශක්තියක් වී දිගටම ඔබගේ සේවය පවත්වා ගෙන යාමට අපගේ සුබ පැතුම්. ඇත්ත වශයෙන්ම කම්කරුවන් වන අප වෙනුවෙන් මෙවැනි සංවිධානයක් පිහිටුවා ගනිමින් කම්කරුවන් වෙනුවෙන් ගෞරවය පුද කරන අතර මෙම සංවිධානය දිනෙන් දින කම්කරු අයිතීන් දිනා ගැනීමට ශක්තිය හා ධෛර්යය සියළු දෙනාටම ලැබේවායි ප්‍රාර්ථනා කරන අතරම අවුරුදු 39ක් ලබන මෙම ඔබ සංවිධානය දිනෙන් දින දියුණු වේවායි ප්‍රාර්ථනා කරමු. පුරා දශක 04 කට ආසන්න කාලයක් මුළුල්ලේ දහඩියත් සමඟ පොර බදින කම්කරු ජනතාව වෙනුවෙන් ඔබ අප හා සම්බන්ධ වී අප හට ලබා දුන් මහගු මෙහෙවර හා කැපවීම වෙනුවෙන් කම්කරු අයිතීන් හා සම්බන්ධ විවිධාකාර දැනුම් සම්භාරයන් ඔස්සේ අප හට ලබා දුන් උපදෙස් මහත් සේ අගනේය. විවිධ බාධක කම්කටොළු මධ්‍යයේ අප වෙනුවෙන් ලබා දුන් සේවය හා මෙහෙවර වෙනුවෙන් සංවත්සරික සැමරුම වෙනුවෙන් හදපිරි සුභාසිංශන එක් කර සිටිමු.

**බියගම ඩාබිඳු සාමාජිකයින්**

නිදහස් වෙළඳ කලාපයේ කාන්තාවන් වෙනුවෙන් වසර 38ක් කැපවී කළ විශිෂ්ට සේවයට ඩාබිඳු සාමූහිකයට සුබ පැතුම්! ඔබගේ නොසැලෙන යෝධ ශක්තිය හරහා කාන්තාවන්ගේ ජීවිත වෙනස් කරමින්, වඩාත් ශක්තිමත් සහ ඵලදායී යාන්ත්‍රණ නිර්මාණය කිරීමට ඔබ දායක වී ඇත. සාමූහිකයේ නිර්මාතෘ සමන්මලී මහත්මිය සහ සාමූහිකයට නායකත්වය ලබා දෙන චමිලා තුෂාරි සහෝදරිය ඇතුළු කණ්ඩායමේ සියළු දෙනාගේ කැපවීමට ගරු කරමි. මේ කරන සේවය පහසු නැති බව දනිමි දවස ගානේ මුහුණදෙන අර්බුද, ගැටළු වලට ඉක්මන් ප්‍රතිචාර අවශ්‍ය වේ. කෙතරම් අසීරු වුවද, ඒ ප්‍රශ්න වලට මැදිහත් වෙමින්, සාධාරණත්වය හා යුක්තිය වෙනුවෙන් ඔබ සටන් කරයි. ඩාබිඳු සාමූහිකයේ ශක්තියත් එයමයි - ඔබේ සැබෑ බලවේගය, ඔබගේ මනුෂ්‍යත්වයයි. ඔබ කරන අමිල කාර්යය සඳහා මම සුබ පැතුම් පමණක් නොව, හෘදයාංගම කෘතඥතාව ප්‍රකාශ කරමි. ඔබගේ උත්සාහය අප සැම දිරිගන්වයි. ඔබට ශක්තිය හා ධෛර්යය පතමි !

**ධම්මිකා - කටුනායක**

டாபிந்து நீ பெண்களின் - அறிவுக்கண்களை திறந்தாய்

சமூகத்தில் தலை நிமிர்ந்து நிற்க ஆதரவும் தந்தாய்

வறிய மக்களுக்கு உரிய நேரத்தில் பசி போக்கினாய்

எமது சிறுவர்கள் கல்வி சிறக்க நீ கரம் கொடுத்தாய்

பெண் தினமாம் மகளிர் தினத்தை தவறாது கலை கட்டி கொண்டாட்டத்துடன் நிற்கின்றாய்

அறுசுவை உணவும் தந்தாய்.. பரிசும் தந்தாய்

தேவைக்கு ஏற்ப பயிற்சியும் தந்தாய்

அது மட்டுமா? உன் பணி சொல்லிக்கொண்டே போகலாம்

உன் பணியில் நீ சிறந்து நானும் உதவுவேன்

வவுனியா மாவட்ட இணைப்பாளர்

ஜெயசாந்தன் சிவரூபி




දිව රෑ දිවිපතා අප වැඩ කරන විට
දූ දරුවන් නිසා අපි දුක් විඳින විට
හැකිලෙස අපේ සේවය ඉටු කරන විට
ඩාබිඳු සාමුහිකයේ සෙවනයි අපට
අසරණ අපේ මෙහෙයද ඔබ අගයන්නේ
කන බොන දෙය පවා අපහට ලැබ දෙන්නේ

වරදක් වෙතොත් අප අයිතිය සුරකින්නේ
අප වෙනුවෙන් ඔබයි නිති පෙරටම එන්නේ
ඩාබිඳු හෙළන අප අයිතිය සුරකින්න
ඩාබිඳු සංවිධානය ඇත දුක දන්න
මී බිඳු වැනිය අපහට ඔබගේ වදන
සුරලොව දෙවියනේ ''ඩාබිඳු''
රැක දෙන්න
**ප්‍රියංගි - බියගම**

**ඩාබිඳු ඔබට,**

ඔබ කාන්තා දැනුමේ දැස් විවර කළා.

ඔබ සමාජයේ ඉහළට නැගී සිටීමට සහාය වුණා.

ඔබ නියම වේලාවට දුප්පත් ජනතාව තෘප්තිමත් කළා.

ඔබ අපේ දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න අත දුන්නා.

කාන්තා දිනයේදී ඔබ කාන්තා දිනය කලාවෙන් හා සැමරුම්වලින් සමරනවා.

අවශ්‍ය පරිදි රසවත් ආහාර සහ තෑගි සහ පුහුණුව ලබා දෙනවා.

ඔබේ කාර්යයන්ට පැසසීම් අපමණයි...

අපි ඉදිරියටම යමු............

වව්නියාව සම්බන්ධීකාරක

**ජයප්‍රකාශ් සිවරූබී.**

ඩාබිඳු පුවත් පත නොකඩවා පවත්වා ගෙන යෑම සම්බන්ධවත්, කලාපයේ කාන්තාවන් බලවත් කිරීමට ගනුලබන උත්සාහය ප්‍රශන්සනීයයි. ඔබගේ ඉදිරි කාර්යයන් සදහා අපගේ සුභ පැතුම්.

**සිරිමල් පීරිස්**

**ජනතා සෞඛ්‍ය සංසදය**

வறிய மக்களின் வாழ்வுக்கு வளமூட்டிய டாபிந்துவுக்கு இனிய அகவை திருநாள் நல்வாழ்த்துக்கள்!

**நிக்சன்**

39வது அகவையில் காலடியெடுத்து வைக்கும் டாபிந்துவிற்கு எமது மனமார்ந்த வாழ்த்துக்கள்.

**ஏஞ்சல்**

ஆடைத் தொழிலாளர்களின் உரிமைகளை பாதுகாக்க முனைகின்ற டாபிந்து கூட்டமைப்பிற்கு 39வது அகவை நல்வாழ்த்துக்கள்!

**ரினுகா**




வியர்வைத் துளியை போன்று வீறுகொண்டு

எம்மை நோக்கி பயணித்து வியர்வை துளிகளின்

ஒன்றியத்தின் இந்த பிறந்த தினத்தை கிளிநொச்சி

மாவட்ட இணைப்பாளர் ஆகிய நான் வாழ்க

வாழ்கவென வாழ்த்தி நிற்கின்றேன்

**நன்றி**

**ஶ்ரீகாந்தி**

# වසරක මෙහෙවර



විවිධ දුෂ්කරතා යටතේ ඇඟළුම් කර්මාන්තශාලාවල සේවය කරන කාන්තාවන්ගේ වෙනුවෙන් පෙනී සිටීම හා මැදිහත්වීම සමාජ සේවා සංවිධානයක් ලෙස ඩාබිඳු අපගේ මූලික ඇගයුම්වලින් එකකි. ඩාබිඳු සාමූහිකය කම්කරු කාන්තාවන් අරමුණු කර ගනිමින් වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. තනි හා කණ්ඩායම් වශයෙන් මෙම වැඩසටහන් පවත්වන ලද අතර සංවාදමය සාකච්ඡා හරහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක විය. කම්කරු කාන්තාවන් උද්යෝගයෙන් යුතුව මෙම වැඩසටහන්වලට සහභාගී වූ අතර තම අත්දැකීම් හා සේවා ස්ථානවලදී හා එදිනෙදා ජීවිතයේ ඔවුන් අත්විඳින දුෂ්කරතා බෙදා ගන්නා ලදී. මෙහි දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වූයේ,

01. වැඩබිම්වල කාන්තාවන්ගේ මානසික සුවතාවය වෙනුවෙන් වූ උපදේශන වැඩසටහන් මාලාව.
02. කම්කරු අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් වන ප්‍රජා පාදක වැඩසටහන්.
03. ඩාබිඳු සාමූහික සංගමයේ විධායක කමිටු රැස්වීම.
04. ඩාබිඳු සාමූහික සංගමයේ උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් වූ දෙදින වැඩමුළුව.
05. කම්කරු කාන්තාවන් වෙනුවෙන් දියත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්.
06. ඩාබිඳු අපෙන් ඔබට - පොදු කුස්සිය.

කම්කරු කාන්තාවන් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන් මාලාවන් මෙම වසරේ තුන්වන කාර්තුව පුරාවට කටුනායක, බියගම, කිලිනොච්චි හා වව්නියා යන ප්‍රදේශවල දී සාර්ථකව ක්‍රියාත්මක කෙරිණි. මෙහි දී නීතිවේදී ලක්මාලි හේමචන්ද්‍ර, ලංකා බැංකු සේවක සංගමයේ හිටපු ජ්‍යෙෂ්ඨ උපදේශක කේසර කෝට්ටේගොඩ මහතා, මනෝ උපදේශිකා ගංගා රත්නායක, නීතිඥ ස්වස්ථිකා ආරුලිංගම් යන සම්පත් දායකයින් විසින් මෙම වැඩසටහන් මාලාව මෙහෙය වන ලදී. මෙහි දී මූලික වශයෙන් කම්කරු කාන්තාවන්ගේ ගැටළු හඳුනා ගනිමින් ඒ සඳහා විසඳුම් ලබා දිය හැකි ප්‍රවේශයන් පිළිබඳව සාකච්ඡා කරන ලදී. තව ද රටේ පවතින්නා වූ අති උද්ධමන තත්ත්වය හමුවේ වැටුප් කප්පාදුව හා ඉහළ යන ජීවන වියදම, වැඩ පරිසරය තුළ සිදු වන සේවක අයිතිවාසිකම් පිළිබඳව සේවකයින් දැනුම්වත් කිරීම ද මෙහි දී සිදු විය. තව ද කම්කරුවන් ලෙස දිනා ගත යුතු සේවක අයිතීන් පිළිබඳව දීර්ඝ සංවාදාත්මක දැනුවත් කිරීම් මේ හරහා ක්‍රියාත්මක කෙරිණි. බොහෝ කම්කරු කාන්තාවන් පිටිසර ගම්මානවලින් පැමිණි පිරිස් වන අතර කර්මාන්ත ශාලාවලටම කොටු වී හුදෙකලා ජීවිත ගත කරති. අති උද්ධමන තත්ත්වය, අතිකාල ඉල්ලීම් හා වැටුප් විෂමතා හමුවේ ආර්ථිකව හා මානසිකව බිඳ වැටී ඇති මෙම කාන්තාවන්ට මෙම සේවාවන් ඉතාමත් වැදගත් වූ බව වැඩසටහන් අවසානයේ කාන්තාවන්ගේ අදහස් අනුව පැහැදිලි විය.














# කඳුකර කම්කරුවන්ගේ සමානාත්මතාවයේ ඉල්ලීම වෙනුවෙන් ඩාබිඳු අපි...






'මලෙයහ එළුච්චි පයනම්' කඳුකර කම්කරුවන්ගේ අතීතය පිළිබඳ අනාගත කාලීන සංවාදාත්මක මෙන්ම රූපාන්විත පාගමනයි. එය ශ්‍රී ලංකාවේ නිදහස් හා සමාන පුරවැසියන් ලෙස පිළිගන්නා මෙන් මලෙයහ දෙමළ ප්‍රජාව විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම පිළිබඳවය. මෙයට වසර දෙසීයකට පෙර මෙරටට පැමිණි දා සිට ඔවුන්ගේ පැවැත්ම සඳහා අරගලයක නිරතවීමට සිදුවී තිබේ. ශ්‍රී ලංකාවේ සහ මුලික ජන කණ්ඩායමක් ලෙස පිළිගනිමින් සමාන සැලකීමක් ලබාදෙන ලෙස ඉල්ලා වරින්වර බලයට පත්වූ රජයන් වෙත ඉදිරිපත් කළ අඛණ්ඩ ආයාචනාවලින් මෙම පාගමන සමන්විත විය. මෙය අනෙකුත් ප්‍රධාන ප්‍රජාවන් හා සමානව ස්වාධීන ජන කණ්ඩායමක් ලෙස අනන්‍යතාවක් සඳහා වන මෙම ප්‍රජාවගේ අරගලය ප්‍රතිරාවය කරන ලදී. මලෙයහ දෙමළ ප්‍රජාවගේ ඉතිහාසය, අරගල, ජයග්‍රහණ, ඔවුන්ගේ දායකත්වය, වත්මන් සමාජ-ආර්ථික හා දේශපාලන තත්ත්වය සහ අභිලාෂයන් පිළිබඳව ලාංකික සිංහල, දෙමළ, මුස්ලිම් සහ අනෙකුත් සහෝදර ජනතාව අතර මූලික අවබෝධයක් ඇති කිරීම මෙම ගමනේ අරමුණ විය. තලෙයිමන්නාරම සිට මාතලේ දක්වා දින 16ක් නොකඩවා පා ගමනින් ගමන් කළ අතර ඩාබිඳු සාමූහිකයේ අප ද අගෝස්තු 16 වන දින නාලන්ද සිට මාතලේ දක්වා ඔවුන් සමඟ පා ගමනින් ගමන් කර ඔවුන්ගේ පුරවැසි අයිතිවාසිකම් දිනා ගැනීම උදෙසා වූ මානුෂික ව්‍යායාමය වෙනුවෙන් අපගේ සහයෝගී දායකත්වය ලබා දුනිමු.







# බියගම ඩාබිඳු ශාඛාව විවෘත කිරීම



කම්කරු අයිතීන් වෙනුවෙන් පෙනී සිටින ඩාබිඳු සාමූහිකයේ කම්කරුවන්ගේ වෘත්තීය අයිතීන් වෙනුවෙන් වන "ඩාබිඳු සාමූහික සංගමය" යන නමින් නව ශාඛාවක් වශයෙන් 2023 ජුනි 25 වන දින බියගම දී විවෘත කරන ලදී. උතුරු නැගෙනහිර කම්කරුවන්ගේ ඉල්ලීමක දිගුවක් වශයෙන් ආරම්භ වන මෙම වෘත්තීය සමිතියේ දී කම්කරුවන්ට සිදු වන්නා වූ අයිතීන් කඩවීම් පිළිබඳව උපදේශනාත්මක සහය මෙන්ම නීතිමය සහය ද ලබා දෙනු ඇත. මීට අමතරව කම්කරු කාන්තාවන්ගේ විවේක කාලය ඵලදායීව ගත කිරීම උදෙසා පුස්තකාලයක් පවත්වා ගෙන යාමට ද ඩාබිඳු අපි සැලසුම් කර ඇත. මේ අනුව ඩාබිඳු සාමූහිකය, ඩාබිඳු සාමූහික සංගමය වශයෙන් කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් වන නෛතික ව්‍යාප්තිය සනිටුහන් කරනු ලැබීය. මේ හරහා කම්කරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව ඔවුන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම හා අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් ද, ඩාබිඳු සාමූහික සංගමය වශයෙන් පෙනී සිටීම අරමුණු කර ගනිමින් බියගම නව ශාඛාව ආරම්භ කරන ලදී.



# වසරක ගමන් මඟ




අංක: 221, වෙළඹඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.